# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍ර

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක. 7,303 — 1923ක්වූ ජනවාරි මස 5වෙනි දිනවූ සිකුරාද.


# Part IV.— හතරවෙනි කාණ්ඩය.

---

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**No. 2,204, N.W. P.**—වයඹ දිසාවේ ආණ්ඩුවේ මහ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1923ක්වූ පෙබරවාරි මස 21වෙනි දිනවූ බදාදා පස්වරු 12.30ට කුරුණෑගල කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ දඹදෙනි, හිරියාල, කටුගම්පල, වන්නි සහ දේවමැදි හත්පත්තුවල පිහිටාතිබෙන බිම්කෑබෙලි 31ක්.

සිතියම A. E. No. 1 of B. S. P. P. 525. ගම—දඹදෙනිහත්පත්තුවේ උඩුකහ උතුරුකෝරලේ දම්පැලැස්ස. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | ආන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | පොතුකොලපුරන .. | මීරිගම ඩී. ජේ. අමරතුංග මහත්මයා | හේන .. | 0 | 3 | 28 | 50 |
| 3 | කැටකැලගහමුලවත්ත .. | එම .. .. | පොල්වත්ත, (ඩී. ජේ. අමරතුංග මහත්මයා සහ ඈම්. හොරතලා විසින්අල්ලාගත්හරිය) | 0 | 0 | 23 | 50 |
| 4 | එම .. | — .. .. | එම (මහපාරට ඉතුරුකළහරිය) | 0 | 0 | 11 | —* |
| 2 | පොතුකොලපුරණ .. | — .. .. | හේන (මහපාරටඉතුරුකලහරිය) | 0 | 0 | 15 | —* |

සිතියම F. V. P. 494. ගම—උඩුකහ දකුණුකෝරලේ බෝතමුව.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 27 | ගල්කැපියමූකලාන .. | ඩී. සී. සේනානායක මහත්මයා විසින් අල්ලාගත්හරිය | පොල්, මංකොක්ක ආදිය වගාකලඉඩම | 4 | 2 | 12 | 100 |

සිතියම F. V. P. 471. ගම—උඩුකහදකුණුකෝරලේ පල්ලේමෝරුගම.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 10 | කොරකහහේන .. | එච්. උන්ඩියා සහ ජේ. සඳුමාලි .. | හේන .. | 0 | 2 | 32 | 60 |

සිතියම F. V. P. 458. ගම—උඩුකහනැගෙනහිරකෝරලේ මැදගම්පොල.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 18A | මාරගේහේන .. | බී. එච්. උක්කුනසිංදේ .. | හේන .. | 0 | 1 | 5 | 100† |

සිතියම F. V. P. 424. ගම—හගවත්ත.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 47H | වේරමැදිගලමූකලාන .. | පනලියේ පී. බස්නායක .. | මූකලාන .. | 1 | 2 | 31 | 75 |
| 47I | එම .. | එම .. .. | එම .. | 2 | 0 | 4 | 40 |
| 48B | පිංගොල්ලේමූකලාන .. | එම .. .. | එම .. | 0 | 0 | 3 | 75 |

සිතියම F. V. P. 414. ගම—දම්මැහැර.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 22 | මුරුතගස්පිටියේවත්ත .. | ඩබ්ලිව්. උක්කුමැනිකා .. | හේන .. | 0 | 2 | 3 | 19 |

සිතියම F. V. P. 419. ගම—වඳුව.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 24Q | ගල්ලිදහේන .. | ආර්. ඇම්. පුන්චප්පුහාමි .. | හේන .. | 5 | 2 | 5 | 67 |

| නො. | ඉඩමේ නම. | ඉල්ළුම්කාරයා. | අන්දම. | මහන, අ | රූ. | ප. | අක්කරයක මිල රු. |
|---|---|---|---|---|---|---|---|
| | සිතියම A. E. 6 of B. S. P. P. 614. ගම—උඩපොල ඔතොටකෝරලේ ආරගොඩ. | | | | | | |
| 1 | කහටගස්තැන්නේ මූකලාන | කුඩාගම ඒ. රන්කිරා .. | මූකලාන .. | 3 | 3 | 34 | 80 |
| 2 | එම .. | ඇම්. උක්කුවා වෙල්දුරයා සහ තවත් කෙනෙක් | එම .. | 9 | 0 | 6 | 100 |
| | මුල් සිතියම 5,155. ගම—රකෝපත්තුකෝරලේ කොහාන. | | | | | | |
| 1 | කුරුඳුගොල්ලේහේනේ මූකලාන | අයි. ඇම්. මැක්කම්මා .. | කැලේ .. | 2 | 0 | 25 | 110 |
| | මුල් සිතියම 4,955. ගම—හිරියාලහත්පත්තුවේ නිකවාගම්පහකෝරලේ රක්වාන. | | | | | | |
| 1 | පලුගහකොටුව නොහොත් අඹගහමූලහේන | ඇස්. බී. උක්කුබන්ඩා .. | මූකලාන .. | 10 | 1 | 8 | 27·50 |
| | සිතියම F. V. P. 1,301. ගම—මහගල්බොඩඑගොඩකෝරලේ දෙමටෑව. | | | | | | |
| H 908 | බෙරගහමූලගල්ගොඩ හේන | ඒ. ඒ. ඇම්. සාලි, 158 කොල්ලුපිටිය . | හේන .. | 22 | 2 | 15 | 65 |
| | මුල් සිතියම 5,078. ගම—හැටහගේකෝරලේ අරගම. | | | | | | |
| 1 | කපුහේන නොහොත් ජම්බුගහමූල රජසන්තකේ | ආර්. ඇම්. උක්කුබන්ඩා ... | හේන .. | 2 | 0 | 27 | 45 |
| | සිතියම F. V. P. 1,187. ගම—ඉහලවිසිදෙක්කෝරලේ පරණගම්පිටිය. | | | | | | |
| 1296/6823 | පරණගම්පිටියහේන .. | — .. .. | හේන .. | 33 | 1 | 36 | 55 |
| | සිතියම F. V. P. 1,288. ගම—මහගල්බොඩඑගොඩකෝරලේ පොතුවිල. | | | | | | |
| S 845K | පිදුරුවෙලගේවත්ත .. | ගම්සභාපති ඒ. වී. හේරත් මහත්මයා | හේන .. | 2 | 0 | 36 | 60 |
| F 846 | වැවපිටියේපිල්ලෑව .. | එම .. .. | එම .. | 1 | 0 | 15 | 60 |
| | සිතියම F. V. P. 333. ගම—කටුගම්පලහත්පත්තුවේ මැදපත්තු බස්නාහිර කෝරලේ දඹගහගෙදර. | | | | | | |
| 15½ | දුම්මලදෙනියමූකලාන .. | ඩී. ඩී. කරුණාරත්න මහත්මයා .. | ඇලොගත්පොල්වතත | 1 | 1 | 2 | 75 |
| | සිතියම F. V. P. 1,395. ගම—කිණියමකෝරලේ මොලඑලිය. | | | | | | |
| 1U | පස්කොටුව .. | — .. .. | හේන .. | 9 | 3 | 20 | 35 |
| 1W | එම .. | — .. .. | එම .. | 44 | 1 | 2 | 35 |
| 8A | කහටගහහේන .. | — .. .. | එම .. | 0 | 1 | 17 | 35 |
| 9 | සියඹලාගහහේන .. | — .. .. | එම .. | 23 | 2 | 3 | 35 |
| 9A | එම .. | — .. .. | එම .. | 0 | 1 | 14 | 35 |
| | සිතියම 5,160. ගම—වන්නිහත්පත්තුවේ හතලිස්පහ බස්නාහිරකෝරලේ මීගලෑව. | | | | | | |
| 1 | වැකන්ද පාවුල කෝන්ගහහේන්කොටුව හෙවත් වැකන්දපාවුලකොටුව | බී. රන්කිරාහේනයා .. | බාලකැලේ | 1 | 3 | 0 | 20 |
| 2 | වැකන්දපාවුලහේන .. | — .. .. | එම වැකන්ද දියේ ඉතුරුකළ හරිය | 0 | 3 | 7 | —* |
| | සිතියම 5,157. ගම—මාගුල්ඔතොටකෝරලේ හුලෝගෙදර. | | | | | | |
| 2 | මාරගහමූලහේන .. | ඇස්. ඇන්. ඩබ්ලිව්. ඇම්. කිරිහාමි සහ හීන්කිරිබන්ඩා | කැලේ .. | 3 | 0 | 0 | 20 |
| 1 | එම .. | — .. .. | එම පාරට ඉතුරුකළ හරිය | 0 | 0 | 18 | —* |
| 3 | එම .. | — .. .. | එළිමහන්ඉඩම අඩිපාරට ඉතුරුකළහරිය | 0 | 0 | 27 | —* |
| | සිතියම 4,718. ගම—මාගල්ලේගම. | | | | | | |
| 1 | ගලබිඳපුහේන .. | — .. .. | හේන .. | 10 | 1 | 30 | 20 |
| | සිතියම 5,158. ගම—හුලෝගෙදර. | | | | | | |
| 2 | කුඩාවැවපාවුල නොහොත් සියඹලාගහමූලහේන | ඩබ්ලිව්. ඇම්. රන්හාමි .. | කුඹුර .. | 10 | 0 | 29 | 17·50 |
| 1 | එම .. | — .. .. | බාලකැලේ (වැව්බැම්ම දියේ ඉතුරුකළ හරිය) | 0 | 3 | 26 | —* |
| | සිතියම 4,959. ගම—හන්තිහේකෝරලේ ඇලබඩගම. | | | | | | |
| 2 | කුඹුක්වලහේන .. | ඒ. ඒ. දෙන් දුවිත් .. | හේන .. | 1 | 0 | 37 | 20† |
| | සිතියම F. V. P. 215. ගම—දෙවමැදිහත්පත්තුවේ මයුරවතීකෝරලේ දීකිරිකෑව. | | | | | | |
| 6V | කෝන්ගහමූලවත්ත .. | වී. උන්ගා .. | හේන .. | 1 | 0 | 23 | 42 |

* විකිනීමට නොවේ. † කලින් මිලේටගත් මුදලේ ඉතිරිකොටස නොගෙවූ නිසා.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණා වයඹ දිසාවේ ආණ්ඩුවේ මහ ඒජන්ත උන්නාන්සේගෙන්ද ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වම් 1922ක්වූ දෙසැම්බර් මස 23වෙනි දින කොළඹ මහලේකම්කාරීස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්කාරීස් වම්හ.

මෙහි පහත සඳහන්කරනුලබන රජසන්තක ඉඩම් කැබැල්ල, එලතුරු ගස් සහ එලවළු වැවීමට වර්‍ෂ 1923ක්වූ පෙබරවාරි මස 20වෙනි දින පටන් පහත සඳහන් කොන්දේසිවලට යටත්ව අවුරුදු 50කට බදුගැනීමට කරන ඉල්ලුම්පත්‍ර වර්‍ෂ 1923ක්වූ පෙබරවාරි මස 1වෙනි දිනට නොහොත් ඊට කල්මත්තෙන් ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් භාරගනු ලැබේ. ඉල්ලුම්කාරයා ඔහුගේ සම්පූර්ණ නම ගම සහ ලියුම් ලැබෙන ස්ථානය දැනුම්නුදුන්නොත්ද අක්කරයකට නොහොත් ඉන් කොටසකට රුපියල් 3ක බැගින් මිතින්දෝරු ගාස්තුව ආණ්ඩුවේ ඒජන්තතුමා වෙත බඳිනතුරුද එකී ඉල්ලුම්පත්‍රයක් භාරගනු නොලැබේ. ඉඩමේ බද්ද විකුණනතුරු නොහොත් ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් ඉඩම නොවිකුණන්ට නියම කළොත් එසේ නියමකරනතුරු එකී බැඳපු මුදල ආපසු දෙනු නොලැබේ. වර්‍ෂ 1923ක්වූ පෙබරවාරි මස 20වෙනි දින පස්වරු 1ට බදුළු කච්චේරියේදී බදු විකිණීම රජසන්තක ඉඩම්වල බදු විකිණීම සම්බන්ධ ආණ්ඩුවේ රෙගුලාසිවල ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වැඩි ඉල්ලුම්කාරයා බද්ද ගැනුම්කාරයා වන්නේය.

ඌව පළාතේ බදුළු දිස්ත්‍රික්කේ මහපලාතකෝරළේ පිහිටි ආණ්ඩුව සන්තක ඉඩම් කැබලි 1ක්.

අන්තිම ගම් සිතියමේ නොම්මරය 115. ගම—උඩුකිඳ මහපලාතකෝරළේ කහගොල්ල.

අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 55AF1 | අම්බලංකපොල්ලගල්කන්දේපතන .. | දියතලාවේ ජී. ඇම්. ක්‍රැබ් මහතා .. | පතන .. | 3 1 1 |

බද්දේ සාමාන්‍ය කොන්දේසි.

(*a*) ඉහත සඳහන් ඉඩම අවුරුදු 50කට බදු දෙනුලැබේ. මෙම කාලය ඉකුත්වූවිට බද්ද අළුත්වැඩියාකරනු නොලැබේ.

(*b*) මෙම ඉඩමට ප්‍රිමියම් වන තක්සේරු මුදල අක්කරයකට රුපියල් 12ක් වේ.

(*c*) මෙම ඉඩමට බදු මුදල අවුරුද්දට අක්කරයකට රුපියල් 12ක් වේ.

(*d*) මෙම බදු මුදලඅවුරුදු 25කට වරක් වෙනස්කරනු ලැබේ.

(*e*) මෙම බද්ද අවසානයේදී ගොඩනගනලද ගොඩනැගිලිවල සහ වගාවේ වටිනාකමද ගෙවන්නේ නැත.

(*f*) මෙම ඉඩම එලතුරු ගස් සහ එලවළු වැවීමට පමණක් බදු දෙනුලැබේ.

(*g*) ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගේ අවසර නොමැතිව නොහොත් මෙහි සඳහන් කොන්දේසිවලට විරුඬව යම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි සාදනුලැබුවේ නම් ඒ සියල්ලම රජසන්තක වෙනුලැබේ.

(*h*) බදුදෙන අයගේ කැමැත්ත කල්මත්තෙන් ලිවිමකින් නොගෙන බද්ද වෙන කෙනෙකුට පවරාදීමටවත් විකිණීමටවත්, සියල්ල හෝ එයින් කොටසක් හෝ යමකට යටත්කිරීමටවත් බදු ගැනුම්කාරයාට බැරිය.

(*i*) මෙම බද්දේ වැඩිදුර කොන්දේසි බදුල්ලේ කච්චේරියෙන් දැනගත හැකිවේ, එය විකිණීමට මත්තෙන් කියවා දෙනු ලැබේ.

මෙම ඉඩම සම්බන්ධ වැඩිදුර කාරණ ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒකේ සිතියම සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද දැනගත හැකිය.

වර්‍ෂ 1922ක්වූ දෙසැම්බර් මස 23වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

වර්‍ෂ 1922ක්වූ නොවැම්බර් මස 24වෙනි දින නිකුත්කරණලද අංක 7,298වේ ගැසට් පත්‍රයේ ප්‍රසිඬකරණලද වයඹ දිසාවේ මුල් සිතියමේ නොමර 5,163වේ රත්මලවල ඉඩම් විකිනීම මීට ඉහතින් ප්‍රසිඬකර තිබෙන ප්‍රකාර දවල් 12ට නොව පෙරවරු 9ට පවත්වනු ලබනබව මෙයින් දැනගත යුතුයි.

වර්‍ෂ 1923ක්වූ ජනවාරි මස 3වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

බී. හෝර්ස්බරෝ,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැණීම සම්බන්ධ දැන්වීම.

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—"බක්ස්පඩ් සර්කස්" නම් ස්ථානය සම්පූර්ණකෙරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම නො. 18,100. ගම—ගම්පහමැදගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මූනමලගහවත්ත .. | පොල්ගහක් අඩංගු ඉඩම .. | ජී. බී. පේරම් .. .. | 0 0 2·7 |
| 2 | එම .. | පොල්ගස් 13ක් සහ හරක්මඩුවක් අඩංගු ඉඩම | ඇම්. ඩී. එලියස් අප්පුහාමි සහ තවත් අය .. | 0 1 5 |
| 3 | කිත්ගහවත්ත .. | හිස්ඉඩම .. .. | ඇම්. ඩී. විලියම් පෙරේරා සහ තවත් කෙනෙක් | 0 0 3 |

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 4 | මූනමලගහවත්ත .. | හිස්බිම .. | ඇම්. ඩී. එලියස් අප්පුහාමි සහ තවත් අය .. | 0 | 0 | 4 |
| 5 | එම .. | පොල්ගස් 27ක් අඩංගු ඉඩම .. | එම .. .. | 0 | 1 | 18·4 |
| 6 | කෝන්ගහවත්ත .. | හිස්ඉඩම .. | දෙන් සයිමන් ජයසුන්දර .. .. | 0 | 0 | 0·8 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දූනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දූනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1923ක්වූ ජනවාරි මස 29වෙනි දින දවල් 12ගේ කනිසමට කොළඹ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දූනගත යුතුයි.

වර්‍ෂ 1922ක්වූ දෙසැම්බර් මස 23වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ගම්පහ පිටිටනිය සම්පූර්ණකෙරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876ගේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 18,098. ගම—ගම්පහ මැදගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | කහටගහවත්ත .. | පොල්ගස් 3ක් අඩංගු ඉඩම .. | කේ. ඕ. පේරස් සිඤ්ඤෝ සහ මර්තිනාහාමි | 0 | 0 | 15 |
| 2 | හික්ගහවත්ත .. | පොල්ගස් 7ක් අඩංගු ඉඩම .. | ඩී. ජේ. ඒ. ජයවර්ධන .. .. | 0 | 0 | 21 |
| 3 | තෙලෙන්ගහවත්ත .. | පොල්ගස් 38ක් අඩංගු ඉඩම .. | ඩී. ඇල්. ජයතිලක .. .. | 0 | 1 | 8·7 |
| 4 | එම .. | පොල්ගස් 85ක් සහ අතුසෙවිලි ගෙවල් 2ක් අඩංගු ඉඩම | ඇස්. දෙන් අග්‍රිරිස් දිසානායක .. | 1 | 0 | 7·2 |
| 6 | සැන්ටහර්මන්ස්වත්ත | පොල්ගස් 2ක් අඩංගු ඉඩම .. | පොලියර්මහතා .. .. | 0 | 0 | 24·8 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දූනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දූනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1923ක්වූ ජනවාරි මස 29වෙනි දින දවල් 12ගේ කනිසමට කොළඹ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දූනගත යුතුයි.

වර්‍ෂ 1922ක්වූ දෙසැම්බර් මස 23වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ජේ. ජී. ෆ්‍රේසර්,
බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

වර්‍ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—දිමියාවේ ස්වභාෂා මිශ්‍රපාඨශාලාවේ වත්ත ලොකුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්‍ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මන්ත්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියම 61. ගම—දිමියාව නවදුන් කෝරළේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 2C | දුව්විකනත්ත .. | වත්ත .. | කේ. ඇම්. පුන්චිමහත්මයා සහ තවත් අයෙක් .. | 0 | 0 | 6 |
| 2D | ආචාරිගේවත්ත .. | එම .. | ඩී. ඒ. පේසත්හාමි සහ තවත් අය .. .. | 0 | 0 | 4 |
| 2E | අළුත්වත්ත .. | එම .. | එම සහ තවත් අයෙක් .. .. .. | 0 | 0 | 11 |
| 3A | දුව්විකනත්ත .. | ලන්ද .. | කේ. ඇම්. පුංචිමහත්මයා සහ තවත් අයෙක් .. | 0 | 0 | 3 |
| 3B | බෙන්තොටගෙවත්ත .. | එම .. | එම .. .. .. | 0 | 0 | 33 |
| 3C | පටිදෙරේකනත්ත .. | එම .. | කේ. ඇම්. කිරිමැනිකෙ සහ තවත් අය .. .. | 0 | 0 | 12 |

එබැවින් ඉඩම් අයිතිකර ගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දූනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දූනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්‍ෂ 1923ක්වූ ජනවාරි මස 30වෙනි දින පස්වරු 2ගේ කනිසමට රත්නපුර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දූනගත යුතුයි.

වර්‍ෂ 1922ක්වූ දෙසැම්බර් මස 21වෙනි
දින රත්නපුරේ කච්චේරියේදීය.

එච්. ඩබ්ලිව්. කොඩ්රින්ටන්,
ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

## මුඩුඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

[මාතර දැන්වීම නො. 8,244.]

මෙහි පහත සඳහන්වෙන ඉඩම් එහි තිබෙන යම් පාරවල් සම්බන්ධව අයිතිවාසිකම් කියන අය ඇත්නම් ඒ අය වනී 1923ක්වූ ජනවාරි මස 5වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මාතර කච්චේරියේදී මාතර පලාතේ ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට තමන්ගේ අයිතිකම් පෙන්වා සිටින්ට නොයෙදුනොත් එකී ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේට වනී 1897නේ, 1899යේ, 1900යේ සහ 1903නේ මුඩුඉඩම් සම්බන්ධ ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් රජසන්තක ඉඩම්ය කියා උන්නාන්සේ විසින් අත්සන් තබාපු ලියවිල්ලකින් එළිදරව්කරණවා ඇත.

ජේ. ඩී. බ්‍රවුන්,
ආණ්ඩුවේ උපඒජන්තතැන.

එකී ඉඩම්වල තොරතුරු.

දකුණු දිසාවේ මාතර දිස්ත්‍රික්කේ මොරවක්කෝරලේ කොටපොල යන ගම පිහිටි මෙහි පහත මිට යාකරපු සිතියම්වලත්* විස්තරකරණු ලබන ඉඩම් කැබලි:—

I.—මුල් සිතියම 45.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 240F | මීගහවත්තේහේන | 0 1 36 |

මායිම්—උතුරට කේ. බබුන්හාමි උරුමකියන මීගහවත්තේහේන; නැගෙනහිරට කේ. බබුන්හාමි සහ තවත් අය අයිතිවාසිකම් කියන මුගුරුමුල්ලේහේන; දකුණට කිරිවානගහ; බස්නාහිරට ආණ්ඩුවට අයිති මීගහවත්තේහේන.

II.—මුල් සිතියම 45.

| බිම්කට්ටිය | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 509½ | අත්තක්කගලදෙනියේ උඩදෙනිය | 0 0 16 |

මිට මායිම්—උතුරට නොම්මර 171,717 සිතියමේ ජේන ඉඩම; නැගෙනහිරට නොම්මර 171,717 සිතියමේ ජේන ඉඩම; දකුණට නොම්මර 171,716 සිතියමේ ජේන ඉඩම සහ ආණ්ඩුවට අයිති ගැටබරුකන්ද යන ඉඩම; බස්නාහිරට ආණ්ඩුවට අයිති ගටබරුකන්ද කියන ඉඩම.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 1—2වෙනි පිටුවල ප්ලෑන් බලනු.

---

[මාතර දැන්වීම නො. 8,245.]

මෙහි පහත සඳහන්වෙන ඉඩම් එහි තිබෙන යම් පාරවල් සම්බන්ධව අයිතිවාසිකම්කියන අය ඇත්නම් ඒ අය වනී 1923ක්වූ ජනවාරි මස 5වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මාතර කච්චේරියේදී මාතර පලාතේ ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේ ඉදිරිපිටට ඇවිත් පෙනීසිට තමන්ගේ අයිතිකම් පෙන්වාසිටින්ට නොයෙදුනොත් එකී ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේට වනී 1897නේ, 1899යේ, 1900යේ සහ 1903නේ මුඩුඉඩම් සම්බන්ධ ආඥාපණත්වලින් ලැබීතිබෙන බලවල ප්‍රකාරයට, අයිතිවාසිකම් නොකියාපු එකී ඉඩම් රජසන්තක ඉඩම්ය කියා උන්නාන්සේ විසින් අත්සන් තබාපු ලියවිල්ලකින් එළිදරව්කරණවා ඇත.

ජේ. ඩී. බ්‍රවුන්,
ආණ්ඩුවේ උපඒජන්තතැන.

එකී ඉඩම්වල තොරතුරු.

දකුණු දිසාවේ මාතර දිස්ත්‍රික්කේ මොරවක්කෝරලේ බෙරලපනාතර යන ගමේ පිහිටි මෙහි පහත මිට යාකරපු සිතියම්වලත්* විස්තරකරණු ලබන ඉඩම්කැබලි:—

I.—මුල් සිතියම 33.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 338 | දෙළලියාගේදෙනිය | 0 1 9 |

මායිම්—බස්නාහිරට, උතුරට සහ නැගෙනහිරට ආණ්ඩුවට අයිති වැල්ලතේහේන; දකුණට ලියනගේදෙල.

II.—මුල් සිතියම 33.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 459A | ඉදිකඩහේන | 3 2 0 |

මිට මායිම්—උතුරට සබරගමුපලාතේ මායිම; නැගෙනහිරට සහ දකුණට ඇම්. ජනිස්හාමි සහ තවත්අය උරුමකියන මරගල්හේන; බස්නාහිරට ටී. පී. ලොට් 197,298 සහ සබරගමු පලාතේ මායිම.

III.—මුල් සිතියම 33.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 643 | පුහුල්හේනේකන්ද යන ආදිය | 265 0 28 |

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 2—3වෙනි පිටුවල ප්ලෑන් බලනු.

මීට මායිම්—උතුරට සබරගමු පලාතේ පලාත් මායිම; නැගෙනහිරට ජනිස්හාමි සහ තවත්අය උරුම කියන මරලේ හේනද, ආණ්ඩුවට අයිති රිටිගලහේන සහ ඇම්. ජනිස්හාමි සහ තවත්අය උරුම කියන බෙරලුකැටිහේනෙ: දකුණට ආණ්ඩුවට අයිති මහයාය සහ ගලබිඳුනහේන යන ආදිය; බස්නාහිරට කන්දේකුඹුරේ දෙලද, කහන්දලගේ ඔක්කුහාමි සහ තවත් අය උරුමකියන නොම්මර 1—12 දරණ කරව්හේන සහ වී. පී. ලොට් නොම්මර 60,236 දරණ ඉඩම.

දැනගතයුත්තක් :—අක්කර 21කුත් පර්චස් 30හක විසාලකම ඇති මෙහි පසින සඳහන්වෙන ඉඩම් ඉහල ජෙන නොතීසියේ ජෙන ඉඩමට අයිතිනැත.

මුල් සිතියම 33.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| A639 | පුවක්වත්ත | 0 2 15 |
| A640 | එම | 1 2 23 |
| A641 | පුවක්වත්තේදෙනිය | 0 2 12 |
| A644 | පුහුල්හේනේ කන්දේගලවත්තේහේන (වී. පී. 197;298) | 18 1 20 |
| | | 21 0 30 |

---

[කොළඹ දූන්වීම නො. 8,246.]

වර්‍ෂ 1897තේ, 1899යේ සහ 1900යේ 1903නේ මුඩු ඉඩම් සම්බන්ධ ආඥාපණත් ප්‍රකාර දැනුම්දීම.

මෙහි පහත සඳහන්වෙන ඉඩම සම්බන්ධව අයිතිවාසිකමක් ඇති කෙනෙක් ඉන්නවානම් ඒ අය වර්‍ෂ 1923ක්වූ ජනවාරි මස 5වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත කොළඹ කච්චේරියට ඇවිත් බස්නාහිර දිසාවේ ඒජන්ත උන්නාන්සේ ඉදිරිපිට පෙණීසිට එකී ඉඩමට තිබෙන අයිතිකම නොහොත් ඒ සම්බන්ධව තිබෙන වැදගත්කම තමන් හෝ ලියවිල්ලකින් කියා නොසිටියොත් එකී ඒජන්ත උන්නාන්සේ විසින් ඉහතකී ආඥාපණත්වලින් උන්නාන්සේට ලැබී තිබෙන බලපුළුවන්කම්වල ප්‍රකාරයට, අයිතිකමක් කියා නොසිටිය ඒ ඉඩම රජසන්තක ඉඩමක් බව උන්නාන්සේගේ අත්සන ඇති ලියවිල්ලකින් එළිදරව්කරණ බව මෙයින් දැනගත යුතුයි.

එච්. ඒ. හිවුන්හැම්,
කොළඹ සහ මීගමු දිස්ත්‍රික්කුවල ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේ.

මෙහි සඳහන් ඉඩම මැදින් වැටී තිබෙන යම් පාරකට අයිතිවාසිකම් කියාසිටීම, එකී ඉඩමට අයිතිවාසිකම් කියාසිටීම හා සමාන බව සැලකිය යුතුයි.

කියන්නේ මේ ඉඩම ගැණයි.

මීට යාකරණලද සිතියමේ* පෙනෙණ බස්නාහිර දිසාවේ කොළඹ දිස්ත්‍රික්කුවේ නැගෙනහිර සීනැකෝරළේ ගඟබඩ පත්තුවේ දන්ගල්ල යන ගමේ පිහිටා තිබෙන බිම්කට්ටිය :—

නො. 18 දරණ බ්ලොක් සර්වේ මුල් සිතියමෙන් ගන්නාලද නො: 3 ඇස්ත්‍රැක්කය.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 4 | දෙල්ගහවත්ත | 0 0 6 |

මෙහි පහත සඳහන්වූ මායිම්—උතුරට කුඹුරුවලට වතුරදෙන ඇලද; නැගෙනහිරට දන්ගල්ලේ විහාරේ විසින් අයිතිකම්කියාසිටින පින්ලියද්දකුඹුරද; දකුණට පැපිලියාවල සිට මිතිරිගලට යන පාරද; බස්නාහිරට ආණ්ඩුව විසින් අයිතිකම් කියාසිටින දෙල්ගහවත්තද.

* ඉංග්‍රීසි පිටපතේ තුන්වෙනි කාණ්ඩයේ 3වෙනි පිටේ ප්ලෑනය බලන්න.

---

## ඉල්ලුම්පත්‍ර සඳහා කරණලද දැන්වීම.

බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් වර්‍ෂ 1923ක්වූ ජනවාරි මස 16වෙනි අඟහරුවාද දවල් 12ට කොළඹ කච්චේරියේදී කොළඹ කුරුඳුවත්තේ බදු සිතියමේ පෙනීයන මීට යාකර තිබෙන ලැයිස්තුවේ සඳහන්වෙන ආණ්ඩුවේ ඉඩම් කට්ටිවල තණකොළ සහ එලවළු වවීමට 1923ක්වූ ජනවාරි මස 16වෙනි දින පටන් අවුරුදු 5කට බද්ද ප්‍රසිද්ධ වෙන්දේසියේ මෙහි සඳහන්කරණ කොන්දේසිවලට යටත්ව විකුණනු ලැබේ.

1. වැඩි ඉල්ළුම්කාරයා ගැණුම්කාරයාවේ.

2. බදු මිල අවුරුදුපතා අවුරුද්ද මුලදී ගෙවන්ට ඕනෑය.

3. දැනට පවතින යම් වැටක් හෝ මායිමක් වෙනස්කරන්ට වත් යම් ගහක් කපන්ටවත් ගැනුම්කාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ට අවසර නැත.

4. බදු ඉඩමේ වැටබඳින්ට ඒජන්ත උන්නාන්සේ විසින් නියමකළොත් එසේ කිරීමට බදුකාරයා බැඳිලාය.

5. ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලබාගත් ලියවිල්ලක් පිට අවසර ඇතුව මිස නැත්නම් ඉඩම යම් කෙනෙකුට පවරන්ටවත් නැවත බදු දෙන්ටවත් ගැනුම්කාරයාට අවසර නැත.

6. තණකොළ කන්ට ඉඩමේ ඇරීන සෑම හරක්ම ප්‍රසිද්ධ පාරවල්වල දඩාවතේ නොයනාකාර දිගලිකර තිබන්ට ඕනෑය.

7. ගැනුම්කාරයා විසින් ඉඩම සුද්දෙන් සහ හොඳකාරයෙන් තබාගන්ටත් නාගරික සභාවේ අණපනත් හැටියට ක්‍රියාකරන්ටත් වගපනම් ගෙවන්ටත් ඕනෑය.

8. බදු ඉඩමෙන් බොරළු, වැලි ආදියක් විකුණන්ටවත් ගෙනයන්ටවත් ගැනුම්කාරයාට තහනම්ය. තවද එම ඉඩමට අලාභහානිවෙන කිසි ක්‍රියාවක් කිරීමත් තහනම්ය.

9. මුළු ඉඩම හෝ ඉඩමෙන් යම් කොටසක් ආණ්ඩුවට ඕනෑ කළොත් මාසයක් කල්දුන්විට එවැනි ඉඩම හෝ ඉඩම් කොටස ආණ්ඩුවට භාරදිය යුතුයි. එසේ ආණ්ඩුව විසින් නැවත භාරගන්නා ඉඩම් කොටසට ගනවෙන්ට තිබෙන බද්දෙන් ඒ ප්‍රමාණයට ඉදිරියට ගනවෙන්ට තිබෙන කාලයට බදු මුදලෙන් ආපසු ගෙවන්ට යෙදෙනවා ඇත.

10. ඉහත සඳහන්වෙන කොන්දේසි කඩකළොත් වන්දි මුදලක් නොගෙවා ගැනුම්කාරයා සහ ඔහුගේ වැඩකරුවන් ඉඩමෙන් අහක්කර ඉඩමේ නැවත භුක්තියට පැමිණෙන්ට ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

11. යම් ඉල්ලීමක් භාරගන්ට හෝ නොගන්ටත් ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

ජේ. ජී. ෆ්‍රේසර්,
බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්තතැන වඩින.

වර්ෂ 1922ක්වූ දෙසැම්බර් මස 20වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

1.—කොළඹ කුරුඳුවත්තේ බදු සිතියමේ පේන ඉඩම්වල ලැයිස්තුවයි.

| ඉඩම. | පිහිටීම. | තත්වය. | අ. රූ. ප. |
|---|---|---|---|
| 10 | වැලිකඩ | .. තණකොළ | .. 1 0 6 |
| | | සිතියම 17,990. | |
| 2 | වැලිකඩ | .. තණකොළ | .. 0 3 1·8 |

පුත්තලමේ උතුරු ලුණු ඩිපෝඑකේ තිබෙන නොම්මර 22 සහ 23 දරණ ලුණු ස්ටෝරු අලුත්වැඩියාකිරීමට ඉල්ලුම් පත්‍රයයි.

2. ඉල්ළුම්පත්‍රය සීල්කර වහපු ඇන්විලොප් එකක් තුළ දමා එවන්ට ඕනෑය. එම ඇන්විලොප් උඩ වම්පැත්තේ කොණේ මින් පහත සඳහන් වචන ලියා තිබෙන්ට ඕනෑය. එනම්, "පුත්තලමේ උතුරු ලුණු ඩිපෝඑකේ නො. 22 සහ 23 දරණ ලුණු ස්ටෝරු අළුත්වැඩියාකිරීමට ඉල්ළුම්පත්‍රයයි." තවද මෙම ඉල්ළුම්පත්‍රය වර්ෂ 1923ක්වූ ජනවාරි මස 19වෙනි දින පස්වරු එකට මත්තෙන් පුත්තලමේ ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේට ලැබෙන පිණිස එවන්ට ඕනෑය.

3. ඉල්ළුම්කරන්ට අදහස්කරණතැනැත්තා ඔහුගේ ඉල්ළුම්පත්‍රය එවන්ට මත්තෙන් කොයිම කච්චේරියකහරි "වැන්ඩර් පෝර්ම්ස්" යන ගණන යටතේ රුපියල් 10ක්ද බැඳ රිසිට් එකක් ලබාගන්ට ඕනෑය. එම රිසිට්එක ඔහුගේ ඉල්ළුම්පත්‍රයට යාකර එවන්ට ඕනෑය.

4. ඉල්ළුම්කාරයෙකුගේ ඉල්ළුම්පත්‍රය භාරගත්කල්හි එම ඉල්ළුම්කාරයා භාරගත් වැඩේ හරියාකාර කරදෙන හැටියට ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේ සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙන පිණිස මතුකී රුපියල් 10ය ඇපයක් වශයෙන් තබාගනු ලැබේ. එසේ කොන්ත්‍රාත්එකට බැඳෙන්ට නොයෙදුනොත් එම රුපියල් 10 රජසන්තක කරණුලැබේ.

5. ඉල්ළුම්කාරයාට පුත්තලමේදී ලියුම් ලැබෙන පිණිස නොහොත් එහිදී ලිවුම් භාරදෙන පිණිස ඇඩ්‍රෙස් එකක් නියමකරන්ට ඕනෑය.

6. කොන්ත්‍රාත් එකකට ඇතුල්වී සුමාන 6ක් ඇතුළතදී භාරගත්වැඩේ ඉවරකරන්ට ඕනෑය.

7. වැඩිදුර කාරණ පුත්තලමේ උපඒජන්ත උන්නාන්සේගෙන් (ලුණු) අහ දැනගන්ට පුළුවන.

කරන්ට තිබෙන වැඩවල විස්තර.

දැනට ගොඩනැගිලිවල තිබෙන්නාවූ සියලුම දිරාගිය නොහොත් වෙන යම් විධියකට පාවිච්චිකරන්ට නුපුළුවන් පොල්අතු සහ ලීදඬු අහක්කොට ඒවා වෙනුවට අළුත් සවි ඇති ඒවා දමන්ට ඕනෑය.

මතුකී සියළුම ස්ටෝරුවල වහලවල් අළුත් පොල්අතුවලින් සෙවිලිකරන්ට ඕනෑය. නැවත මාංගු දමන්ට ඕනෑය.

පොල්අතු බිච්චි ඕනෑකරණතැන් අළුත්වැඩියාකර එකී තිබෙන තැන් කෙලින්කරන්ට ඕනෑය. ස්ටෝරුවල දකුණුපැත්තේ බිත්ති කඩාදමා අලුත් ලීදඬු ආදියෙන් ගොඩනගන්ට ඕනෑය.

ස්ටෝරුවල ඇතුල්පැත්තට අළුත් පොල්අතු අල්ලන්ට ඕනෑය. නො. 22කේ ස්ටෝරුවේ දොරට සරනේරුවක් දමන්ට ඕනෑය.

ස්ටෝරුවල නැගෙණහිර සහ බස්නාහිර පැතිවල පිටපැත්තේ බිම පොළවෙන් අඩියක් පස්වලින් උස්සන්ට ඕනෑය. දොරවල් අළුත්වැඩියාකර අළුත් සරනේරු සවිකරන්ට ඕනෑය.

ඇස්. එම්. පී. වැන්දර්කෝන්,
උප ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1922ක්වූ දෙසැම්බර් මස 19වෙනි
දින පුත්තලම් කච්චේරියේදීය.

පුත්තලමේ උතුරු ලුණු ඩිපෝඑකේ තිබෙන නොම්මර 24 සහ 25 දරණ ලුණු ස්ටෝරු අලුත්වැඩියාකිරීමට ඉල්ලුම් පත්‍රයයි.

2. ඉල්ළුම්පත්‍රය සීල්කර වහපු ඇන්වීලොප් එකක් තුළ දමා එවන්ට ඕනෑය. එම ඇන්විලොප් උඩ වම්පැත්තේ කොණේ මින් පහත සඳහන් වචන ලියා තිබෙන්ට ඕනෑය. එනම්, "පුත්තලමේ උතුරු ලුණු ඩිපෝඑකේ නො. 24 සහ 25 දරණ ලුණු ස්ටෝරු අළුත්වැඩියාකිරීමට ඉල්ලුම්පත්‍රයයි." තවද මෙම ඉල්ලුම්පත්‍රය වර්ෂ 1923ක්වූ ජනවාරි මස 19වෙනි දින පස්වරු 1ට මත්තෙන් පුත්තලමේ ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේට ලැබෙන පිණිස එවන්ට ඕනෑය.

3. ඉල්ළුම්කරන්ට අදහස්කරණ තැනැත්තා ඔහුගේ ඉල්ලුම්පත්‍රය එවන්ට මත්තෙන් කොයිම කච්චේරියක හරි "වැන්ඩර් පෝර්ම්ස්" යන ගණන යටතේ රුපියල් 10ක් බැඳ රිසිට් එකක් ලබාන්ට ඕනෑය. එම රිසිට්එක ඔහුගේ ඉල්ලුම් පත්‍රයට යාකර එවන්ට ඕනෑය.

4. ඉල්ළුම්කාරයෙකුගේ ඉල්ළුම්පත්‍රය බාරගත්කල්හි එම ඉල්ළුම්කාරයා භාරගත් වැඩේ හරියාකාර කරදෙන හැටියට ආණ්ඩුවේ උපඒජන්ත උන්නාන්සේ සමග කොනත්‍රාත්තුවකට බැඳෙන පිණිස මතුකී රුපියල් 10ය ඇපයක් වශයෙන් තබාගනු ලැබේ. එසේ කොනත්‍රාත්එකට බැඳෙන්ට නොයෙදුනොත් එම රුපියල් 10ය රජසන්තක කරණුලැබේ.

5. ඉල්ලුම්කාරයාට පුත්තලමේදී ලියුම් ලැබෙන පිණිස නොහොත් එහිදී ලිවුම් භාරදෙන පිණිස ඇඩ්‍රෙස් එකක් නියමකරන්ට ඕනෑය.

6. කොන්ත්‍රාත් එකකට ඇතුල්වී සුමාන 4ක් ඇතුළතදී භාරගත්වැඩේ ඉවරකරන්ට ඕනෑය.

7. වැඩිදුර කාරණ පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේගෙන් (ලුණු) අහ දැනගන්ට පුළුවන.

කරන්ට තිබෙන වැඩවල විස්තර.

දැනට ගොඩනැගිලිවල තිබෙන්නාවූ සියලුම දිරාගිය නොහොත් වෙනයම් විධියකට පාවිච්චිකරන්ට නුපුළුවන් පොල්අතු සහ ලීදඬු අහක්කොට ඒවා වෙනුවට අළුත් සවි ඇති ඒවා දමන්ට ඕනෑය.

මතුකී සියළුම ස්ටෝරුවල වහලවල් අළුත් පොල්අතුවලින් සෙවිලිකරන්ට ඕනෑය. නැවත මාංගු දමන්ට ඕනෑය.

පොල්අතු බිච්චි ඕනෑකරණතැන් අළුත්වැඩියාකර එකී තිබෙන තැන් කෙලින්කරන්ට ඕනෑය.

ස්ටෝරුවල ඇතුල්පැත්තට අළුත් පොල්අතු අල්ලන්ට ඕනෑය.

ඇස්. එම්. පී. වැන්දර්කෝන්,
උප ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1922ක්වූ දෙසැම්බර් මස 19වෙනි
දින පුත්තලම් කච්චේරියේදීය.

## ආණ්ඩුවේ ඉඩම් මිලේට ගැනීම හෝ බදුගැනීමට දෙන ඉල්ලුම්පත්‍ර.

ඌව දිසාවේ ඉල්ලා තිබෙන ඉඩම් මණින ක්‍රමය.

ආණ්ඩුවේ ඉඩම් මිලදී ගැණීමට හෝ බදුගැණීමට දෙන ඉල්ළුම්පත්‍ර සම්බන්ධ මැණීම් ඌව දිසාවේ මින්මත්තට මාරුවෙන් මාරුවට කරනවා ඇත.

2. ඌව දිසාව කොඨාස තුණකට බෙදා තිබේ :—

පළමුවෙනි කොඨාසය නම්: වියළුව යටිකිඳ සහ උඩුකිඳ පලාත්ද වැල්ලවාය පලාතේ කුඹපල්ලකෝරළේද වේ.

දෙවෙනි කොඨාසය නම්: වැල්ලවාය පලාතේ වැල්ලවාය, කෝංගල බින්තැන්න සහ සිතතරම පලාත කෝරලද, බුත්තල පලාතේ කඩුකර සහ බුත්තල කෝරලද වේ.

තුන්වෙනි කොඨාසය නම්: බින්තැන්න සහ වෙල්ලස්ස පලාත්ද, බුත්තල පලාතේ බුත්තල වැදිරට කෝරලේද වේ.

3. තුන්වෙනි කොඨාසය, වර්‍ෂ 1923ක්වූ පෙබරවාරි මස 15වෙනි දින වසනු ලැබේ. මේ දිනයට පසු මේ කොඨාසයේ තුළ ඉල්ළුම්පත්‍රවල ඉඩම් මැනීමට සර්වෙයර් ජනරල් තුමාට අරිනු නොලැබේ. එසේවුවත් මේ දිනේදී වසනලද මේ කොඨාසයට ඇතුළත්වූ ඉඩම් විකිණීමට හෝ බදුදීමට යම් බාදවක් තිබේද නැද්ද දැනගැණීම පිණිස ලියා පදිංචිකරන්ට දෙන ඉල්ළුම්පත්‍ර බාදකරන්නේ නැත.

4. ඊලඟ වසන කොඨාසයනම්, නොම්මර 1කේ කොඨාසයවේ. මේ කොඨාසය ඇතුළත ඉඩම් මිලේට ගන්ට හෝ බදුගන්ට එවන ඉල්ළුම්පත්‍ර පුළුවන් ඉක්මනින් මාවෙත එවන්ට ඕනෑය.

5. නොම්මර 3කේ කොඨාසයේ වැඩ නිමවුනායින්පසු නොම්මර 1කේ කොඨාසය වහන දවස ප්‍රසිද්ධකරණු ලැබේ.

ආර්. ඒ. ජී. පැස්ටින්,
ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වහන්සේ.

වර්‍ෂ 1922ක්වූ දෙසැම්බර් මස 23වෙනි
දින බදුළු කච්චේරියේදීය.

---

## අන්‍ය දැන්වීමයි.

මෙහි පහත අත්සන්කරන මීගමු දිස්ත්‍රික්කුවේ අළුත්කුරු කෝරලේ දූනාගහ පත්තුවේ තෝප්පුවේ පදිංචි මල්කන්කානමලාගේ මක්සිමස් ලූසියන් සිල්වාවන මා යාපනය දිස්ත්‍රික්කුවතුළ සිංහල භාෂාවෙන් ඔප්පුලියා සහතිකකිරීමට බලයලත් ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකුමෙන් පත්කරනලෙස මෙතැන්පටන් තුන්මාසයක් ගියතැන රෙජිස්ත්‍රාර් ජනරල්තුමාගෙන් ඉල්ලීමට අදහස්කරගෙන සිටිනබව වර්‍ෂ 1907තේ අංක 1 දරන ආඥාපණතේ 8වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

මිට,
ඇම්. ඇම්. ඇල්. සිල්වා.

වර්‍ෂ 1922ක්වූ දෙසැම්බර් මස 9වෙනි දිනදීය.

---

H. R. COTTLE, GOVERNMENT PRINTER, COLOMBO, CEYLON.